No. 28/1, Bullers Lane, Colombo 07, Sri Lanka Tele : 011 5654654, 011 5769769 Fax : 011 5627432 Email : pppr2010@gmail.com Web : www.tisrilanka.org

# 2010 ජනාධිපතිවරණයේ වියදම් - විශේෂ වාර්තාව

## හැඳින්වීම

2010 ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා දේශපාලන පක්ෂ සහ රජය විසින් වැය කරනු ලබන මුදල් පිළිබඳව නිවැරදි තත්ත්වය දැක්වීම සඳහා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ පොදු දේපල රැකගැනීමේ වැඩසටහන විසින් මෙම විශේෂ වාර්තාව පිළියෙල කර ඇත. ජනාධිපතිවරණය සඳහා වැයවන මුලු මුදල සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් 2010 පෙබරවාරි අගදී නිකුත්කිරීමට බලාපොරොත්තුවේ. රාජ්‍ය නායකයකු තෝරාගැනීමේදී ආර්ථික මට්ටමින් රටට දැරීමට සිදුවන වියදම් පිළිබඳව ඡන්දදායකයින් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් දැනුම්වත් කිරීම මෙම වාර්තාවේ අරමුණයි.

## 1 වියදම් පිළිබඳ ප්‍රධාන අංශ

මූලික වශයෙන් මැතිවරණ වියදම් කොටස් පහකට වෙන්කළ හැක:

- මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිත්‍යානුකූලව වැයකරන මුදල්
- නීතිය ක්‍රියාවේ යෙදවීමට යන වියදම සහ දේශපාලන පක්ෂ හා අපේක්ෂකයින්ගේ වියදම්
- රජයේ දේපල අනිසි භාවිතය හේතුවෙන් කෙරෙන වියදම්
- සැඟවුණු සහ වර්ග කිරීමට අපහසු වියදම්
- වෙනත් විවිධ කාරණා සඳහා කෙරෙන වියදම්

ජනාධිපතිවරණය සඳහා වැයවන මුදල් පිළිබඳව අවධානය යොමුකරද්දී රජයේ දේපල අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය විස්තරාත්මකව කරුණු අධ්‍යයනය කර ඇත. මෙම වාර්තාව මගින් දේශපාලන පක්ෂ ප්‍රචාරක දැන්වීම් සඳහා වැයකරන මුදල් පිළිබඳ තොරතුරු අනාවරණය කරයි.

2009 දෙසැම්බර් 1 වැනිදා සිට 2010 ජනවාරි 15 වැනිදා දක්වා ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනාගේ දැන්වීම් ප්‍රචාරය සඳහා පමණක් වැය කර ඇති මුදල රුපියල් කෝටි 45 ඉක්මවයි. දැන්වීම් නිර්මාණය කිරීම සඳහා වැයකෙරෙන නිෂ්පාදන ගාස්තු මීට අයත් නොවන අතර විද්‍යුත් මාධ්‍ය සහ පුවත් පත් මගින් ප්‍රචාරය කර ඇති දැන්වීම් සඳහා වැය කර ඇති මුදල් ගණන් බලා ඇත්තේ ඒ ඒ ප්‍රචාරක ආයතන විසින් සාමාන්‍යයෙන් අයකෙරෙන ගාස්තු අනුවය. කෙසේවුවද, මැතිවරණ

දැන්වීම් සඳහා අයකෙරෙන ගාස්තු සාමාන්‍ය ගාස්තු වලට වඩා වැඩිය. මීට අමතරව ඒ ඒ අපේක්ෂකයින්ට වාසිදායක අයුරින් ප්‍රවෘත්ති ප්‍රචාරය, ප්‍රචාරණ වැදගත්කමක් ඇති වැඩ සටහන් යළි යළිත් ප්‍රචාරය කිරීම, සාකච්ඡා, සම්මුඛ සාකච්ඡා, සහ වෙනත් විවිධ වැඩ සටහන් සඳහා වැයකෙරන මුදල් ද එකතුකළ විට මේ මුදල් තවත් බෙහෙවින් වැඩිවේ.

2009 දෙසැම්බර් 31 වැනිදා දක්වා ජනරාල් සරත් ෆොන්සේකාගේ ප්‍රචාරක කටයුතු සඳහා වැයකර තිබූ මුදල රුපියල් 70,54,000 (ලක්ෂ 70) කි. කෙසේවුවවද, 2010 ජනවාරි 15 වැනිදා වන විට මේ වියදම රුපියල් 8,04,46,900 (ලක්ෂ 804) දක්වා වැඩිවී තිබේ. ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙනුවෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයත් 'තාරුණ්‍යයට හෙටක්' සංවිධානයත් එක්ව 2009 දෙසැම්බර් 31 වැනිදා වනවිට රුපියල් 20,00,00,000 (විසි කෝටියක්) වැය කර තිබුණි. 2010 ජනවාරි 15 වැනිදා වන විට මේ මුදල රුපියල් 38,00,00,000 (තිස් අට කෝටියක්)දක්වා වැඩිවිය. විස්තර උප ලේඛනයේ දැක්වේ.

## 2 නිගමනය

මැතිවරණ සඳහා අපේක්ෂකයන් හා දේශපාලන පක්ෂවලට අති විශාල වියදමක් දැරීමට සිදුවේ. එයින් සමහරක් නීත්‍යානුකූල, අවශ්‍ය වියදම් වන අතර සමහරක් අනවශ්‍ය වියදම්ය, අධික ලෙස කෙරෙන මෙවැනි වියදම් අවශ්‍ය වියදම් යැයි පිළිගත නොහැක. සමහර වියදම් පහසුවෙන් තක්සේරු කළ හැකි වුවත් සමහර ඒවා සැඟවුණු වියදම් බැවින් තක්සේරු කළ නොහැක. සමහර වියදම් රජයේ දේපල අනිසි ලෙස භාවිතයෙන් කෙරෙන ඒවාය. ඒ අතර, නීතියෙන් තහනම් කර ඇති හෝ මැතිවරණ කොමසාරිස්වරයා විසින් නිකුත්කෙරන උපදේශ වලට පටහැනිව සිදුකෙරෙන වියදම් ද වේ. සමාජයේ පිළිගත් ආචාර ධර්ම නොතකා දූෂණ කටයුතු සඳහා කෙරෙන වියදම් ද නැත්තේ නොවේ.

දේශපාලන පක්ෂ වලින් සිදුකෙරෙන වියදම් කිසිවිටෙක හෙළි නොකෙරේ. අප වැනි දුප්පත් රටකට ඔරොත්තු දිය නොහැකි අන්දමේ වියදම් මේ අතර වේ. එබැවින් පොදු එකඟත්වයක් මත එවැනි වියදම් අත්හළ යුතුය. රජයේ දේපල අනිසි ලෙස භාවිත කිරීම ද, විවිධ දූෂණ කටයුතු ඇතුලු වෙනත් දේ සඳහා සැඟවූ වියදම් ද පාලනය කළ යුතුය. එවන් වියදම් සම්පූර්ණයෙන් අත්හළ යුතුය.

මැතිවරණ කොමසාස්වරයා, නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්, නිරීක්ෂකයින්, දේශපාලන පක්ෂ නායකයින් සහ සිවිල් සමාජය එක්ව සමාජය විසින් පිළිගත හැකි, නාස්තිය අවම කරන සිද්ධාන්ත මත සකස්වූ වැඩ පිළිවෙලක් පිළියෙල කිරීමට ඇප කැප විය යුතුය.

සීමිත ආර්ථික සම්පත් ඇති, වැඩි ආදායම් සහ ධනය ඇති හා නැති අය අතර පරතරයක් ඇති රටක නිදහස්, සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කිරීම සඳහා නිර්දේශ 2010 පෙබරවාරි අගදී ඉදිරිපත් කිරීමට ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය බලාපොරොත්තුවෙයි.

## උප ලේඛනය - ප්‍රචාරක කටුයතු සඳහා වැයකර ඇති මුදල්

### එක්සත් ජනතා නිදහස් සන්ධානය

| මාධ්‍යය | දැන්වීම් ප්‍රමාණය | වියදම (රුපියල්) |
|---|---|---|
| රූපවාහිනිය | 5,339 | 15,10,41,300 |
| ගුවන් විදුලිය | 3,732 | 1,77,38,800 |
| පුවත් පත් | 512 | 4, 86,15,000 |
| **එකතුව** | **9,583** | **21,73,95,100** |

### තාරුණ්‍යයට හෙටක්

| මාධ්‍යය | දැන්වීම් ප්‍රමාණය | වියදම (රුපියල්) |
|---|---|---|
| රූපවාහිනිය | 6,485 | 14,66,17,800 |
| ගුවන් විදුලිය | 3664 | 1,39,58,400 |
| පුවත් පත් | | |
| **එකතුව** | **10,149** | **16,05,76,200** |

### එක්සත් නිදහස් සන්ධානය/එකසත් ජාතික පක්ෂය/ ජනතා විමුක්ති පෙරමුණ පොදු අපේක්ෂක ජනරාල් සරත් ෆොන්සේකා වෙනුවෙන්

| මාධ්‍යය | දැන්වීම් ප්‍රමාණය | වියදම (රුපියල්) |
|---|---|---|
| රූපවාහනිය | 984 | 6,69,21,100 |
| ගුවන් විදුලිය | 1,183 | 89,64,800 |
| පුවත් පත් | 24 | 45,61,000 |
| **එකතුව** | **2,191** | **8,04,46,900** |